# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2014 අප්‍රේල් මස 24 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2014 අප්‍රේල් මස 25 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 17.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

**2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2014 අප්‍රේල් මස 24 වන දින]

එල්.ඩී.—ඕ. (අයි.එන්.සී) 18/2012.

**සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

''සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය'' යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන මණ්ඩලයක් එකී මණ්ඩලයේ සාමාජිකයන් විසින් එකඟ වූ රීතිවලට අනුව, එකී මණ්ඩලයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී මණ්ඩලය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී මණ්ඩලය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී මණ්ඩලය සංස්ථාගත කරනු ලැබීම සඳහා ඉල්ලීමක් කර ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය සංස්ථාගත කිරීම.

**2.** (1) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු ''මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ දැනට සාමාජිකයන් වශයෙන් සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු බඳවාගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය'' යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද, නඩු පැවරිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

2—PL 006617—2,200 (2012/03)

(2) සංස්ථාව 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එම පනතේ විධිවිධාන සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) බුද්ධ ශාසනයේ සුභසිද්ධිය ප්‍රවර්ධනය කිරීම උදෙසා පියවර ගනු ලබන අදාළ අධිකාරීන් වෙත සහාය දීම;

(ආ) භික්ෂු සමාජයේ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම උදෙසා පියවර ගැනීමට අදාළ අධිකාරීන් වෙත සහාය දීම;

(ඇ) දුරබැහැර ප්‍රදේශවල පිහිටා ඇති බෞද්ධ සිද්ධස්ථාන සංවර්ධනය හා පුනරුත්ථාපනය ප්‍රවර්ධනය කිරීම පිණිස අදාළ අධිකාරීන් වෙත සහාය දීම;

(ඈ) බෞද්ධ භික්ෂූන් වහන්සේලා හා ගිහි බෞද්ධ ජනතාව අතර, මිත්‍රශීලී බැඳීම ඇති කිරීම තහවුරු කිරීම සඳහා අදාළ අධිකාරීන් වෙත සහාය දීම ;

(ඉ) "දහම් පාසල් අධ්‍යාපනය" දියුණු කිරීම සඳහා අදාළ අධිකාරීන් වෙත සහාය වීම;

(ඊ) දහම් පාසල්වල ආචාර්යවරුන් හා ශිෂ්‍යයන්ගේ සුභසාධනය උදෙසා ක්‍රියා කරනු ලැබීමට අදාළ අධිකාරීන් වෙත සහාය වීම;

(උ) බාහිර බලපෑම්වලින් බෞද්ධ පාරම්පරික උරුමයන් ආරක්ෂා කිරීම හා එම උරුමයන් වැඩිදියුණු කිරීම සඳහා අදාළ අධිකාරීන් වෙත සහාය ලබා දීම;

(ඌ) බෞද්ධ ධර්මය අදහන තැනැත්තන් අතර, බෞද්ධ සිරිත් විරිත් ප්‍රචාරය කිරීම සහ ඒවා ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනීම පිණිස අදාළ අධිකාරීන් වෙත සහාය දීම; සහ

(එ) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම පිණිස සංස්ථාවේ දිස්ත්‍රික්ක හා පළාත් මට්ටමින් ක්‍රියාත්මක වන ශාඛාවලට මග පෙන්වා ඒවා අධීක්ෂණය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.

ආණ්ඩුවේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කටයුතු සමඟ ගැටුම් ඇති නොවන බවට සංස්ථාව සහතික විය යුතු බව.

**4.** ආණ්ඩුවේ හෝ පළාත් සභාවක ඕනෑම අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව පවත්වාගෙන යනු ලබන යම් කාර්යයක් සහ සංස්ථාවේ කාර්ය අතර ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් සංස්ථාවේ අරමුණු ක්‍රියාත්මක කළ යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය, මේ පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වනු ලබන ධූර දරන්නන් යම් සංඛ්‍යාවකින් සමන්විත වන (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන) විධායක කමිටුවක් විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

(2) (අ) මෙ පනත ක්‍රියාත්මකවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමයේ කමිටුවේ ධූර දරන නිලධරයන්, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට පළමු මණ්ඩලය පත් කරනු ලබන තෙක් හෝ තෝරාගනු ලබන තෙක් සංස්ථාවේ කමිටුව වශයෙන් ක්‍රියාත්මක විය යුතු ය.

(ආ) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට එක් අවුරුද්දක කාලයක් ඇතුළත සංස්ථාවේ පළමු කමිටුව පත් කිරීම හෝ තෝරා ගැනීම කළ යුතු ය.

(3) (අ) අනුශාසකවරුන් සහ උපදේශකවරුන් ඇතුළුව කමිටුවේ ධූර දරන සෑම නිලධරයකුම අවුරුදු තුනක කාලයක් සඳහා පත්කර ගත යුතු හෝ තෝරා පත්කර ගත යුතු අතර එම අවුරුදු තුනක කාලය අවසන්වීමෙන් පසුව එම ධූර දරන නිලධාරියා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත තෝරා පත්කර ගැනීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(ආ) යම් ධූර දරන නිලධරයකු මියයෑම, ඉල්ලා අස්වීම, නොහැකියාවකට පත්වීම හෝ ධූරයෙන් ඉවත් කිරීම නිසා පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක දී, කමිටුව විසින් සංස්ථාවේ

රීති පිළිබඳ සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පියවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත්කර ගත යුතු හෝ පත්කර ගත යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරා පත්කර ගනු ලබන හෝ පත් කර ගනු ලබන තැනැත්තා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධූර දරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතරින් යම් පරමාර්ථයක්, ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම උදෙසා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියා, කාරණා සහ දේවල් කිරීමට, ඉටු කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය:—

(අ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන යම් නිශ්චල දේපලක් මිලදී ගැනීම, අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම, හුවමාරු කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් නියාදනය කිරීම, බැඳීමකට යටත් කිරීම හෝ බැහැර කිරීම;

(ආ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම සඳහා හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට කෙලින්ම හෝ සංස්ථාව විසින් බලය පවරනු ලැබූ සංස්ථාවේ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් ඇතුළත්වීම ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම;

(ඇ) මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග, පරිත්‍යාග හෝ රික්තවරණ භාර ගැනීම:

එසේ වුව ද, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් විධායක කමිටුව විසින් මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතිය ලබාගත යුතු ය;

(ඇ) ස්වකීය මුදල් ආයෝජනය කිරීම සහ යම් බැංකුවක ජංගම, තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම;

(ඉ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන යම් මුදලක් සුදුසුයයි විධායක කමිටුව විසින් සඳහන් කරනු ලබන ආකාරයට සහ එසේ සුදුසුයයි සලකනු ලබන ඇප මත, යම් බැංකුවකින් හෝ ආයතනයකින් ණයට ගැනීම හෝ ලබා ගැනීම; සහ

(ඊ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි යෙදවීම, මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම.

සංස්ථාවේ රීති.

7. (1) සංස්ථාව විසින් සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සාමාජිකයන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල විය යුතු ය:—

(අ) සාමාජිකත්වය වර්ගීකරණය කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, සාමාජිකත්වයෙන් ඉවත් කිරීම, ඉල්ලා අස්වීම හෝ නෙරපීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු;

(ආ) කමිටුවේ ධුර දරන්නන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්යය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ පත්වීම්, බලතල, කාර්ය සහ කර්තව්‍ය හා කොන්දේසි හා නියමයන්;

(ඈ) විධායක කමිටුවේ හෝ එහි යම් අනුකමිටුවක රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු

කාර්ය පරිපාටිය, රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී කටයුතු පවත්වාගෙන යාම;

(ඉ) සංස්ථාවේ හා විධායක කමිටුවේ නිලධරයන්ගේ සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඊ) සංස්ථාවේ දේපල, පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ එහි අරමුණු ඉටු කර ගැනීම සහ සංස්ථාව විසුරුවා හැරීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් (1) වන උප වගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනි ම රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සෑම කල්හිම මෙම වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ තත්කාලයේ බලපවත්වන රීතිවලට යටත් විය යුතු ය.

(4) මෙම වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීති රජයේ ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

සාමාජිකයන් ලියාපදිංචි කිරීම.

**8.** සාමාජිකයන්ගේ නම්, ලිපිනයන් සහ අනෙකුත් අත්‍යාවශ්‍ය තොරතුරු ඇතුළත් කරන ලද සාමාජිකයන්ගේ නාම ලේඛනයක් කමිටුව විසින් පවත්වාගෙන යා යුතු ය.

සංස්ථාවේ අරමුදල හෝ ප්‍රදාන.

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාව සඳහා සහ සංස්ථාව වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබුණු සියලුම මුදල් කමිටුව විසින් නිශ්චය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ප්‍රමාණයක සංස්ථාවේ ගිණුමේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මෙම පනත යටතේ, ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හා ඉටු කිරීමේ දී, සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

10 . (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. විගණනය හා ගිණුම්.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් රජයේ විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව විගණකාධිපතිවරයා විසින් පත්කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මෙම වගන්තියේ කාර්ය සඳහා “සුදුසුකම්ලත් විගණකවරයා”, යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, සාමාජිකයකුගෙන් යුත් එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

වාර්ෂික වාර්තාව.

11. (1) මණ්ඩලය විසින් සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහාම සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමග වාර්තාව අදාළ වසරට පසුව එන වර්ෂයේ සය මාසයක් ඉකුත් වීමට පෙර බුද්ධ ශාසන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හා 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය) පනත යටතේ පත්කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී සංස්ථාව වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙනම ගිණුමක් (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව සමග යැවිය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට ගෙවිය යුතු ණය.

12. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවති සංගමය විසින් ගෙවිය යුතු සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංගමයට අය විය යුතු සියලු ණය සහ සංගමය වෙත ගෙවිය යුතුව ඇති සියලු සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාව විසින් නිශ්චල සහ චංචල දේපල දැරිය හැකි බව.

13. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව සංස්ථාවට නීතියෙහිලා හැකියාව සහ බලය ඇති අතර එවැනි සියලු දේපල විකිණීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව මේ පනතේ කාර්යය සඳහා ඒ සියලු දේපල සංස්ථාව විසින් දැරිය යුතු ය.

මුදල් සහ දේපල අදාළ කර ගැනීම.

14. කවර ආකාරයකින් හෝ ලබා ගන්නා සංස්ථාවේ මුදල් හා දේපල සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම උදෙසා පමණක් අදාළ කරගත යුතු අතර, එහි කිසිදු කොටසක් ලාභාංශ, ප්‍රසාද දීමනා, ලාභ හෝ අන්‍යාකාරයකින් සෘජුවම හෝ වක්‍රව සංස්ථාවේ සාමාජිකයන් වෙත ගෙවීම හෝ පැවරීම නොකළ යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

15. (1) සංස්ථාවේ මුද්‍රාව කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර,

ඔවුන් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එම සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිර විය යුතු ය.

(2) සංස්ථාවේ මුද්‍රාව කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි කමිටුවේ යම් ධුර දරන්නකු භාරයේ තැබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ.

**16.** (1) සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපලක් ඉතිරි වුවහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර, බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) 1 වන උපවගන්තියේ කාර්ය සඳහා උචිත ආයතනය සංස්ථාව විසුරුවා හැරීමට ප්‍රථම කැඳවනු ලබන මහ සභා රැස්වීමක දී පැමිණ සිටින සාමාජිකයන්ගෙන් බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**17.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**18.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.